# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 17 දරන
# ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ: ශත 60 යි. තැපැල් ගාස්තුව: රු. 1 00 යි.

## 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 105/90

**1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1989 අංක 7 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමයේ "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්, 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1991 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1992 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (i) ඡේදයේ "එහි ශේෂය ද" යන වචන වෙනුවට "එහි ශේෂය ද;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ii) ඡේදයේ "එහි ශේෂය ද" යන වචන වෙනුවට "එහි ශේෂයද;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ii) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:—

"(iii) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින්—

(අ) සියයට 50 කට නොඅඩු ප්‍රමාණයක් 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර ද;

(ආ) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂයද;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ අග " සියයට 7 1/2 ක් ; සහ " යන වචන සහ ඉලක්කම් වෙනුවට " සියයට 7 1/2 ක් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ " සියයට 7 1/2 ක් " යන වචන සහ ඉලක්කම් වෙනුවට " සියයට 7 1/2 ක් ; සහ " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන්—

(i) 1991 ජූලි මාසය සඳහා ඒ සේවානියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ; සහ

(ii) 1991 ඔක්තෝබර් මාසය සඳහා ඒ සේවානියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහා අධිභාරය ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්—

(අ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1988 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්—

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක්

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක—

1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ; සහ

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ කිරීමට ඔහුට නියම කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයක් ගෙවීමට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.".

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.